# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2289/17 – 2022 ජූලි 19 වැනි අඟහරුවාදා – 2022.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2007 දෙසැම්බර් මස 31 වැනි දින අංක 1530/09 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2007 අංක 391 දරන ආඥාවේ කැබලි අක්ෂර **A** ලෙස සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: LD/05/2006/PISD/430.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: කර/5/3/අත්/16.
2022 ජූනි මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරකන්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක GA/KRN/07/722 හා 2007.07.12 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.285 ක් වන පුංචි බොරකන්දවත්ත නැමැති ඉඩම් කැබැල්ලට මායිම්:

**01. කැබලි අක්ෂර 'A' – පුංචි බොරකන්දවත්ත – ප්‍රමාණය: හෙක්. 0.285 ක් පමණ**

උතුරට: අනුරේඛණ අංක GA/KRN/03/983 කැබලි අක්ෂර D, මු.පි.ගා. 2776 හි කැබලි අංක 3, මු.පි.ගා. 2936 හි කැබලි අංක 3, මාර්ගය සහ මු.පි.ගා. 2936 හි කැබලි අංක 2; නැගෙනහිරට සහ දකුණට: හි.පි. 46197; බටහිරට: අනුරේඛණ අංක GA/KRN/03/983හි කැබලි අක්ෂර D, මු.පි.ගා. 2776 හි කැබලි අංක 3, මු.පි.ගා. 2936 හි කැබලි අංක 3, මාර්ගය සහ මු.පි.ගා. 2936 හි කැබලි අංක 2.

EOG 07 – 0098

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2016 අගෝස්තු මස 25 වැනි දින අංක 1981/52 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2016 අංක 176 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2016/HW/202.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: ඉ/4/8/රංගල්ලේපොල නාකලගමුව
2022 ජුනි මස 30 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුකහ කෝරළේ උතුර සුළු කොට්ඨාසයේ, අංක 1060, රංගල්ලේපොළ, අංක 1059 නාකලගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසවල, රංගල්ලේපොල, ඕතර බෙම්මුල්ලේගෙදර, මැදගමුව, හෝලගමුව ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කු. 2367 හා 2017.03.10 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස්:

01. **කැබලි අංක 109 – ගිරානකන්ද, ගල්කඩුල්ලේහේන – ප්‍රමාණය: හෙක්. 0.0056 ක් පමණ**

උතුරට: මූ.පි. ඒ 27 හි කැබලි අංක 16; නැගෙනහිරට: කැබලි අංක 110, 116 හා 117; දකුණට: කැබලි අංක 117; බටහිරට: කැබලි අංක 117 සහ මූ.පි. ඒ 27 හි කැබලි අංක 22 සහ 16.

02. **කැබලි අංක 110 – ගිරානකන්ද, ගල්කඩුල්ලේහේන – ප්‍රමාණය: හෙක්. 0.0022 ක් පමණ**

උතුරට: මූ.පි. ඒ 27 හි කැබලි අංක 16; නැගෙනහිරට සහ දකුණට: කැබලි අංක 116; බටහිරට: කැබලි අංක 109.

03. **කැබලි අංක 112 – ගල්කඩුල්ලේහේන – ප්‍රමාණය: හෙක්. 0.0337 ක් පමණ**

උතුරට: මූ.පි. ඒ 27 හි කැබලි අංක 16; නැගෙනහිරට: කැබලි අංක 97, 100 සහ 113; දකුණට: කැබලි අංක 113; බටහිරට: කැබලි අංක 116 සහ මූ.පි. ඒ 27 හි කැබලි අංක 16.

04. **කැබලි අංක 116 – ගල්කඩුල්ලේහේන – ප්‍රමාණය: හෙක්. 0.0334 ක් පමණ**

උතුරට: කැබලි අංක 109 සහ 110; නැගෙනහිරට: කැබලි අංක 112, 113 සහ කැබලි අංක 115; දකුණට: කැබලි අංක 115; බටහිරට: කැබලි අංක 117, 109 සහ 110.

05. **කැබලි අංක 117 – ගල්කඩුල්ලේවත්ත, ගල්කඩුල්ලේහේන – ප්‍රමාණය: හෙක්. 0.0443 ක් පමණ**

උතුරට: කැබලි අංක 109; නැගෙනහිරට: කැබලි අංක 109, 116, 115 සහ 118; දකුණට: කැබලි අංක 118; බටහිරට: මූ.පි. ඒ 27 හි කැබලි අංක 22.

EOG 07 – 0099

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.